# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2471/33 – 2026 ජනවාරි මස 13 වැනි අඟහරුවාදා – 2026.01.13**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

**1992 අංක 59 දරණ සත්ත්ව රෝග පනත**

**5 වන වගන්තියේ කරනු ලබන නියමය හා ඊට ආනුෂංගික විධිවිධාන**

1992 අංක 59 දරන සත්ත්ව රෝග පනතේ පළමු වන උපලේඛනයේ සඳහන් සංස්පර්ශක රෝගයක් වන අප්‍රිකානු සූකර උණ රෝගය (ASF) පසුගිය මාස කිහිපය තුළ ශ්‍රී ලංකාව තුළ විවිධ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වාර්තා වූ බැවින්, එය අධි ව්‍යාධිජනක වෛරසයක් වන බැවින් හා තවදුරටත් පැතිරීමට ඉඩ ඇති හෙයින්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කහඳ කනත්තගේ සරත් වන මා එම පනතෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,

ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක එම පනතේ කාර්යය සඳහා අප්‍රිකානු සූකර උණ රෝගය (ASF) සඳහා අවදානම් ප්‍රදේශයන් ලෙස ද,

(1) ඌරන් රෝග අවදානම් සතුන් ලෙස ද,

මෙම නියමයෙන් තවදුරටත් ප්‍රකාශයට පත්කරමි.

(2) මෙම නියමය, *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක වන අතර, කලින් ඉවත් කළහොත් මිස හෝ එම පනතේ 5(3) වගන්තිය අනුව වලංගු කාලය දීර්ඝ කළහොත් මිස ක්‍රියාත්මක වන දින සිට මාස 03කට නොවැඩි කාලයක් සඳහා වලංගු වන අතර, රෝග තත්ත්වය අනුව කාලය දීර්ඝ කිරීමේ හැකියාව ඇත.

02. මෙම නියමය වලංගුව පවතින කාලය තුළ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වන මා,

(1) ඇති වී තිබෙන අප්‍රිකානු සූකර උණ රෝගය (ASF) අවදානම් ප්‍රදේශයට සීමා කිරීම සඳහා හා පැතිරීමට ඇති ඉඩකඩ වැළැක්වීම සඳහා අවශ්‍ය වන පහත සඳහන් ක්‍රියා හා කටයුතු මෙයින් තහනම් කරමි:


1A – G 046107 – 13 (2026/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

I. සත්ත්ව රෝග පනතේ 5 (4) වගන්තිය යටතේ සියලුම අවදානම් සහිත ඌරන්, ඌරු මස් සහ එම නිෂ්පාදන හෝ රෝග කාරකය මගින් අපවිත්‍ර විමේ අවධානමක් සහිත කිසිවක්, 1999 දෙසැම්බර් 03 දින අංක 1108/23 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝගයේ VII ආකෘතියට අනුකූලව කොට්ඨාස භාර පශු වෛද්‍ය නිලධාරිවරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව අවදානම් ප්‍රදේශය තුළ හෝ ඉන් පිටතට ප්‍රවාහනය කිරීම, ඉවත් කිරීම, රැගෙන යාම හෝ පලවා හැරීම.

II ඉහත වගන්තිය ප්‍රකාරව ප්‍රවාහනය සඳහා නිකුත් කළ බලපත්‍රයක් නොමැති ඌරන් මස් පිණිස ඝාතනය කිරීම

III මෙම නියෝගයේ නම් කරන ලද බලයලත් නිලධාරියකුගේ අවසර පත්‍රයක් නොමැතිව ඌරන්, ඌරු මස් සහ එම නිෂ්පාදන හා රෝග කාරකය මගින් අපවිත්‍ර විය හැකි කිසිවක්, විකිණීම, විකිණීමට පාත්‍ර කිරීම, ගබඩා කිරීම හෝ බෙදා හැරීම සහ ඌරු මස්වලින් නිෂ්පාදන සකස් කිරීම.

VI. අදාළ රෝග හේතුවෙන් මරුමුවට පත්වූවා හෝ ආසාදිත වූවායැයි සැකයට හේතු වූ යම් සතෙකුගේ මළකුණක් හෝ එහි කොටසක් හෝ වෙනත් කිසියම් අවදානමට ලක් වූ ද්‍රව්‍යය අපහරණය කිරීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස්වලට අනුව මිස, ජලය සම්බන්ධ කිසිදු ස්ථානයකට දැමීම, වෙනත් සතුන් විසින් වෙනත් ස්ථානයකට හෝ ප්‍රදේශයකට හෝ රැගෙන යාමට හැකිවන පරිදි යම් ස්ථානයකට දැමීම හෝ ස්ථානගත කිරීම.

V. මෙම නියෝගයේ නම් කරන ලද බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කරන ලද ඝාතකාගාරයක/ගබඩාවක/ මස් සැකසුම් මධ්‍යස්ථානයක හැර වෙනත් ඝාතකාගාරයක/ගබඩාවක/ මස් සැකසුම් මධ්‍යස්ථානක ඝාතනය කිරීම/ ගබඩා කිරීම/ සකස් කිරීම.

VI. ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් නිකුත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරන ලද ගොවිපළ ලියාපදිංචි කිරීමේ සහතිකය නොමැතිව සූකර ගොවිපලක් පවත්වාගෙන යාම.

03. ආසාදිත නොවූ අභිජනන/ තර කරන/වාණිජ ගොවිපළවල සිටින සතුන්, අභිජනනය කිරීම/ විකිණීම/ ඝාතනය කිරීම /මස් සැකසීම පහත සඳහන් නිර්නායක මත පදනම්ව අවසර දෙමි.

I. අභිජනන ගොවිපල සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ත්ව අභිජනන අංශයේ ලියාපදිංචි අභිජනන ගොවිපලක් විය යුතුය.

II. සූකර සතුන් අභිජනනය කිරීම, පැටවුන් අලෙවි කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරන ලද පරීක්ෂණයක් සිදු කර ඉන් පසුව ලබාගත් සෞඛ්‍ය සහතිකයක් ලබාගෙන තිබිය යුතු වේ.

III. සතුන් තර කිරීම, අලෙවිකිරීම හා ඝාතනය කිරීමේදී එම සතුන් මෙම රෝගය සඳහා ආසාදිත නොවන බවට බලයලත් නිලධාරියකු විසින් පරීක්ෂාවකින් තහවුරු කර ගත යුතු වේ.

VI. මිලදී ගන්නා/ ලබා ගන්නා ලද / ඝාතනය කරන / සතුන්ගේ ප්‍රවාහනය සඳහා ලබාදුන් සත්ත්ව සෞඛ්‍ය සහතිකවල පිටපතක් සැමවිටම ගොවිපළ/ ඝාතකාගාරය තුළ තබා ගත යුතුවේ.

04. ආසාදනය වූ ගොවිපල තුළට සතුන් ඇතුල් කිරීම.

(1) සතුන් අළුතින් ඇතුල් කර නැවත ගොවිපල ආරම්භ කිරීමට පෙර කොට්ඨාස භාර පශු වෛද්‍ය නිලධාරි වෙතින් මේ සඳහා අනුමැතියක් ලබා ගත යුතු වේ. අපේක්ෂිත ගොවිපල මනාලෙස විෂබීජහරණය වී ඇති බවටත්, ජෛව ආරක්ෂණ ක්‍රමවේද ලබා දී ඇති මාර්ගෝපදේශයන් අනුව පවත්වාගෙන යන බවටත්, කොට්ඨාස භාර පශු වෛද්‍ය නිලධාරි විසින් තහවුරු කරගත යුතුවේ.

05. සත්ත්ව රෝග පනත මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,

(1) මෙම නියෝගයේ 2(1) වගන්තියෙන් තහනම් කරන ලද ක්‍රියා සිදුකිරීම වැළැක්වීම හා එවැනි කටයුතුවල නියැලෙන අයට විරුද්ධව නීතිමය කටයුතු කිරීම යන කාර්යය සඳහා එම පනතේ 3(3) වගන්තිය යටතේ බලයලත් නිළධාරි වශයෙන් කටයුතු කිරීම සඳහා ද ඒ වෙනුවෙන් එම පනතේ 13 වැනි වගන්තියේ සඳහන් බලතල ක්‍රියාත්මක කිරීමටද, පහත සඳහන් නිළධාරීන්ට බලය පවරමි.

I . අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

II. අධ්‍යක්ෂ (වනජීවී සෞඛ්‍ය) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

III. ප්‍රධාන නාගරික පශු වෛද්‍ය නිලධාරීන්, මහනගර සභා

IV. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

V. සියලුම පළාත් අධ්‍යක්ෂකවරුන් - පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

VI. විෂයානුබද්ධ විශේෂඥ - පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

VII. දිස්ත්‍රික් භාර නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ සියලුම දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරිවරු

VIII. දිස්ත්‍රික්ක භාර පශු විමර්ශන නිලධාරීන්

IX. සියලුම කොට්ඨාස භාර රජයේ පශු වෛද්‍ය නිලධාරීන් හා ඔහු/ඇය යටතේ සිටින රජයේ පශු වෛද්‍ය නිලධාරීන්

X. සියලුම නාගරික පශු වෛද්‍ය නිලධාරීන්

XI. සියලුම වනජීවී පශු වෛද්‍ය නිලධාරීන්

XII. ශ්‍රී ලංකා පොලිස් සේවයේ සියළුම පොලිස් නිළධාරීන්

**කහඳ කනත්තගේ සරත්,**
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2026 ජනවාරි මස 03 වැනි දින,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ.පෙ 13 , ගැටඹේ, පේරාදෙණිය.

EOG 01-0154